# ගිලිහුණු පෙති 16

මං ආපහු බස් එකෙන් බැහැල එතනම තිබුණු බුක් ෂොප් එකක් ඇතුලට ගියා කුමාර එනකං. ඒ වෙද්දී මගේ හිතේ පොඩි බයක් තිබුනා මොනාහරි අවුලක් වෙයි වගේ දෙයක්. ඒ නිසා මම ෆෝන් එක සයිලන්ට් කරලා තියාගෙන හිටියේ. පැය බාගයක් වගේ යද්දී කුමාර ස්ටෑන්ඩ් එක ලඟට ආවා කියලා කෝල් කරා. මම ඉක්මනින් එළියට ඇවිල්ල වීල් එකට නැග්ගා.

*මොකෝ මිස්? මොනාහරි අවුලක් ද?*

*යමුකෝ කුමාර අයියා මම කියන්නම් කෝ*

*මොකෝ මිස්. මිනිහා මිස්ට දැන් ඉන්නේ දෙන්නේ නැති සීන් එකක්ද?*

*ඔව් අයියේ. දැන් නං මට මහා වදයක් වෙලා තියෙන්නේ.*

*මිනිහට අර හෝටල් කාරය එක්ක තියෙන ගනුදෙනුව මොකද්ද? අනික එකා තමයි වැඩිපුර සද්දේ දැම්මේ*

*උන් දෙන්න යාළුවො. අනික උන් දෙන්න තමයි අර මම ඔයාගෙන් ඉන්න video එක ලීක් කරලා මාට්ටු වුනේ*

*නෑ මේ ඒකද? ඒක තමයි ඒ ආමි කාරය නිකං මට දැකල හුරු වගේ පේරුනේ. මට ඒ වෙලේ ඕක මීටර් වුනේ නැනේ. එහෙනම් ඒ වෙලේම පොලිසියට අල්ල දෙනවා නේ. ඉතින් නෝනා මේවා දන්නේ නැතුවද යාලු වුනේ මිනිහ එක්ක*

*ඔව් අයියේ. මම මිනිහව විස්වාස කරලා යාලු වුනා. මෙහෙ ආවට පස්සේ තමයි සතා මොකාද කියලා අඳුරගත්තේ*

*ඉතිං දැන් මොකද ඔය තවත් නෝනා පස්සේ ඔච්චර පන්නන්නේ දෙන්නත් එක්කම*

*උන්ට බලාපොරොත්තු වෙච්ච වැඩේ කරගන්න බැරි උනානේ. ඒකයි*

*ඒ කිව්වේ මිස්?*

*අර වගේ video එකක් කරගන්න*

*මොකක් කිව්වා?*

ඔව්. මටත් ඒ දේම කරන්න තමයි දෙන්න එකතුවෙලා ට්රයි කරේ. ඒ උනාට මම දෙන්නටම හොද පාඩමක් ඉගැන්නුවා. ඒ නිසයි ඔය මාත් එක්ක ඔච්චර ඔරොප්පු

යකෝ මුන්ව එල්ලලා ගහන්න ඕන එහෙනම්. හැබැයි මිස්. උන් දෙන්න නං මිස්ව මරන්න තරම් කේන්තියකින් හිටියේ

ඔව් ඒ නිසයි මටත් දැන් පොඩ්ඩක් බය හිතුනේ. මම අර යාලුවට කෝල් කරාම කිව්වා දෙන්න එක්ක ආයේ ටවුම පැත්තට ආවා කියලා

එතකොට ඒ මිස්ගේ මහත්තය නෙමේද?

නෑ අයියේ. මට ඔයාට ඉතින් ඒ විස්තර කියන්න බැරි නිසා මම බොරුවක් කිව්වේ. ඒ කෙල්ලවත් ක්රිෂාන් තියාගෙන ඉන්නේ ඔය විදියටම රවට්ටලා. ඒ කෙල්ලට කරගන්න දෙයක් නැති නිසා දැන් ඔහොම ඉන්නවා

යකෝ ඒ කියන්නේ මෙතන ලොකු ගේම් එකක් යනවා නේ

ඔව්. කොහොමත් වැඩි කලක් නං එයාලට ඔහොම රඟන්න වෙන්නේ නැති වෙයි. අද පොලිසියෙන් දැනගත්ත නේ

ඔව් ඔව්. විස්තර ඔක්කොම අරගෙන ගියේ. ඒ නිසා ආයේ ඇවිල්ල සද්ද නං දාන්න වෙන්නේ නෑ. අනික මම දැන් දන්නවනේ විස්තරේ. මම බලගන්නම්කො ආයේ අවොත් ඒ පැත්තේ

අනේ අයියේ ඔයාල ඕවට පැටලෙන්න යන්න එපා. ඊට පස්සේ කොහෙන් කෙල වර වේවිද දන්නේ නෑනේ

එහෙම කොහොමද මිස්? මේක අපේ ගම. පිට උන්ට ඇවිල්ල මේ සද්දේ දාල යන්න. අනික කැම්පස් එකේ ඉන්න ළමයි නිසා තමයි අපිත් කීයක් හරි හොයාගෙන ළමයින්ට කන්න දෙන්නේ. එහෙම එකේ අපෙත් යුතු කමක් තියෙනවා එහෙම මොනාහරි වෙනවත් කතා කරන්න. විශේෂයෙන් ගෑනු ළමයින්ට

තැන්ක්ස් අයියේ. ඒ උනාට මේක ඔහොම දිගට අදුනොත් කැම්පස් එකේ හැමෝමත් දැන ගනීවි. එහෙම උනොත් මට මෙහෙ ඉන්නත් බැරි වෙනවා නේ

නෑ ඒක මම බලාගන්නම්. පාක් එකේ උන් ටික මම හැන්ඩ්ල් කරගන්නම් මිස්.

අනේ මේ ගැන අර ගිහන්ලට කියන්නත් එපා කුමාර අයියේ

නෑ මිස්. මං මේ ගැන කාටවත් නොකිය ඉන්නම්. මට තේරෙනව මිස් ඉන්න තත්වේ. ඒ නිසා එහෙම දෙයක් වෙන්න දෙන්නේ නෑ

අනේ තැන්ක්ස් අයියේ

ඊට පස්සේ හොස්ටල් එනකම්ම මම පාරේ බල බලා ආවේ අරුන් ගේ කාර් එක කොහේ හරි තියේවිද කියලා බලන ගමන්. මගේ හිත කිව්වෙම මුං ෂුවර් එකටම මම එනකං මග රැකලා ඉන්නවා ඇති කියලා උදේ වෙච්ච දේ නිසා. ඒ නිසා මම කුමාරට කියලා වීල් එකේ දෙපැත්තේ රෙදි දෙකත් දා ගත්තා. මම හිතුව වගේම අපේ හොස්ටල් එකට හැරෙන තැන බස් හෝල්ට් එකට එහායින් කාර් එක නවත්තල තියෙනවා මම දැක්කා. ක්රිෂාන් ඉන්නවා එලියට වෙලා බස් හෝල්ට් එක දිහා බලාගෙන සිගරට් එකකුත් පත්තු කරගෙන.

කුමාර අයියේ. මම ඔයාට කිව්වේ නැද්ද? අර බලන්න

කොහෙද මිස්?

අර බලන්නකෝ අතන කඩේ ළඟ. කාර් එක නවත්තල තියෙනවා

යකෝ ඔව් නේන්නම්. මුන්ට නං කිසි ලැජ්ජාවක් නෑනේ මෙච්චර දෙයක් වෙලත්

අපි දැන් මොකද කරන්නේ අයියේ

මොනා කරන්නද? ඔයාව මම බස්සල ඇවිල්ල බලන්නම්කෝ මොකද කරන්නේ කියලා

අනේ එපා. පස්සේ ඕවා කොහෙන් නවතීද දන්නේ නෑ නේ

නෑ නෑ මිස් බය නැතුව ඉන්නකෝ. මම අද කරන්නම් ආයේ මේ පැත්තේ නො යෙන්න වැඩක්

අනේ රණ්ඩු කරන්න නං යන්න එපා. පස්සේ ඕකුන් මට මෙහෙ ඉන්න දෙන එකක් නෑ

මිස්ට කිව්ව නේ. මම ඒ දේවල් බලාගන්නම්. මොකද උදේ සිද්දිය මම ඔක්කොම බලාගෙන නේ හිටියේ

දැන් මොනාද කරන්න යන්නේ කියන්නකෝ.

*මම මිස්ව හොස්ටල් එකෙන් බස්සල ඇවිල්ලම ඉන්නම් කො*

*නෑ මම මෙතනම ඉන්නම් මේක ඇතුලේ. මාව පේන්නේ නෑනේ එයාලට. ඔයා මෙතන නවත්තල යන්න වීල් එක*

*හරි එහෙනම් මිස් පොඩ්ඩක් ඔහොම ඉන්නකෝ*

එහෙම කියලා කුමාර කෝල් එකක් අරං කිව්වේ වීල් පාක් එකේ ඔක්කොම ටික එක්කං හන්දියට එන්න කියලා. ඊට පස්සේ වීල් එකෙන් බැහැල හන්දියේ හිටියේ පාක් එකේ අය එක්කත් මොනාද කතා කරා. විනාඩි 5ක් වත් ගියේ නෑ අපේ හොස්ටල් එක ළඟ තියෙන වීල් ඔක්කොම වගේ ආවා. හන්දියේ ටිකත් එකතු උනාම ඔක්කොම 10කට වැඩි. පස්සේ ඔක්කොම ගිහිං කාර් එක ළඟ නවත්තල ගිහින් කතා කරනවා පේනවා මට. මුලින්ම කුමාර තමයි ගිහිං කතා කරේ ක්රිෂාන් එක්ක. ටික වෙලාවක් යද්දී මට තේරුණා තත්වේ එච්චර හොද නැති වෙන සීන් එකක් තියෙන්නේ කියලා. මම ඉක්මනට සඳුන් අයියට කෝල් එකක් ගත්තා.

*අනේ අයියේ. පොඩි හදිස්සියක්*

*මොකද්ද නංගි. අරුන් ආයෙම ඇවිල්ලද?*

*ඔව් නේ. මං අර වීල් පාක් එකේ කුමාර එක්ක ආවෙත් ටවුමේ ඉදලම ෂුවර් නැති නිසා. මුං දෙන්න ඇවිල්ල මග ඍක ගෙන ඉන්නවා. පස්සේ කුමාර වීල් පාක් එකේ ඔක්කොම එක්කගෙන ඇවිල්ල කතාවට ගියා. දැන් නං ගුටි හුව මාරුවක් යාවි වගේ*

*එහෙමද? හරි මම ඉක්මනට OIC ට විස්තරේ කියන්නම්. එක අත කට ඕකුන් ගුටි කාල එන එකත් හොදයි. ඒක අපේ වැඩවලට පහසු වක් වෙනවා*

*මොනාහරි කරන්න අය්යේ. නැත්තන් මොනා වේවිද දන්නේ නෑ*

මම කෝල් එක තියල බලද්දී මට පේනවා කුමාර ක්රිශාන්ගේ කොලරේ එකෙන් අල්ලගෙන ඉන්නවා. ඒ එක්කම දැක්කා අරයවත් කාර් එකෙන් එලියට ඇදල අරගෙන මූනට දෙකක් දෙනවා. ඒ වෙලේ නං මම හොදටම බය වෙලා හිටියේ. මොකද දැන් පොලිසියෙන් ආවොත් කුමාර අයියලට පොලිසි යන්න වේවි කියලා. මම එනිසා කුමාර අයියට කෝල් එකක් ගත්තා එතනට යන්න බැරි නිසා.

*ඒත් මගේ කෝල් එක රිංග්ස් ගියාට එයාට ඇහුනේ නැතුවද කොහෙද ගත්තේ නෑ කෝල් එක. මම ආයේ ගත්තා. ඊට පස්සේ නං කතා කරා*

*ඔව් කියන්න මිස්*

*අනේ අයියේ ඔතන රණ්ඩු කරන්න එපා. දැන් පොලිසියෙන් ඒවි. මම කෝල් එකක් දුන්නා. OIC මහත්තය එනවා කිව්වා උදේ ආපු*

*අහ්හ් ඒක හොදයි. හරි මම එනකං මෙයාව තියා ගන්නම්*

පස්සේ කෝල් එක කට් කරලා අනිත් අයට මොනාද කිව්වා කුමාර අයියා. ඊට පස්සේ කට්ටිය ගහන එක නවත්තල දෙන්න ගෙන මොනවද අහනව වගේ පේනවා. විනාඩි 10ක් වත් ගියේ නෑ පොලිස් ජීප් එක ආවා එතනට. මම කල්පනා කරේ මම එතනට යනවද නැද්ද කියලා. ඒත් මාව දැක්කොත් මම මේ දේවල් ප්ලෑන් කරලා කරා කියල හිතන නිසා මම එහෙමම හිටියා සද්දේ නැතුවම.

පොලිස් ජීප් එක ආවට පස්සේ තමයි කට්ටිය පොඩ්ඩක් එහෙට මෙහෙට වුනේ. මොකද ඒ වෙද්දී වීල් සෙට් එකට අමතරව ගමේ කට්ටිය එකතු වෙලා තිබුනේ. මට දැන් එතන වෙන දේ දැන ගන්නම ඕනා. ඒත් එතනට යන්න බැරි නිසා මං ආයේ කුමාර අයියට කෝල් එකක් *ගත්තේ*

*ඔව් මිස් කියන්න*

*ඔහොම කෝල් එකේ ඉන්න ඔයා. මට මොනාද කතා වෙනෙන් කියලා අහගන්න ඕනා*

*හා හරි මිස්. මම කෝල් එක ඕන එකේ තියන් ෆෝන් එක සාක්කුවට දාගන්නම්*

*එහෙම කියල එයා ෆෝන් එක උඩ සාක්කුවට දාල ආයේ කතාවට සෙට් වුනා. දැන් මට ඇහෙනවා කතා කරන දේවල් ටික. උදේ ආපු ඔෆිසර්ලම ඇවිල්ල හිටියේ. ඒ නිසා වැඩේ තවත් ලේසි උනා*

*කුමාර - සර්ලම ආව එක හොදට ගියා. මෙයාට උදෙත් අවවාද කරලා යැව්වට අහල නෑනේ සර්. දැනුත් ඇවිල්ල මෙතනට වෙලා පැයක් විතර ඉන්නවලු*

*පොලිස් - ඔව් මටත් දැන් ආයේ කෝල් එකක් ආවා. ඒකයි මේ ආවේ. කියනවා මොකද්ද තමුන් ලට මෙහෙ තියෙන වැඩේ*

ක්‍රිෂාන්- නෑ සර් මේ මේ අපි... නෑ සර් අපි ආවේ .... මෙයාගේ නංගිව බලන්න...

පොලිස් - දැන් උදෙත් කිව්වා නේද නංගි කියලා. තමුන්ට නංගිගේ නමවත් කියා ගන්න බැරි උනානේ

කුමාර - මුගේ බොරු සර්. මුන් මේ කැම්පස් එකේ අහිංසක කෙල්ලොන්ව එක එක ඒවාට මාට්ටු කරගන්න දඟලන්නේ. මම දන්නවා නේ මුගේ හැටි. කෙල්ලොන්ව රවට්ටලා කරන වැඩ සර්ට ආරංචි වෙලත් ඇති

පොලිස්- නෑ ඒ මොනාද ඒ?

කුමාර- ඇයි සර් අර ටික කාලෙකට කලින් video එකක් ලීක් වෙලා හොටෙල් එකක් සීල් කරේ. ඒ මේකා ගේ හොටෙල් එකනේ. ඔය ඉන්නේ අජිත් එකා තමයි ඒ video එකේ ඉන්නේ, ඉන්නකෝ සර්ට මම ඕනේ නං video එකත් පෙන්නන්නම්

පොලිස්- නෑ ඒක නං මාත් දැක්කා. එකට inquiry එකකුත් ගියානේ. මෙයට ඇප දුන්නේ මුකුත් දන්නේ නෑ කියලනේ

කුමාර- මුගේ බොරු සර්. සල්ලි වලට මුන් කොහොමහරි බේරිලා. එහෙම නං මේ ඉන්නේ අජිත් එකා. දෙන්න එක්ක එකට ඉන්නේ කොහොමද?

පොලිස්- තමුසෙගෙ කතාව ඇත්ත. මේ ගැන අපි බලාගන්නම්. දැන් එනවා යන්න දෙන්න එක්ක පොලිසියට. ඉතුරු ටික මම බලාගන්නම්

කුමාර- සර්ට ඕන නං මම video එක එවන්නම්. සර් තව එකක් මේ යකා හොටෙල් එකේ තව කෙල්ලෙක්ව බලෙන් තියාගෙන ඉන්නවා. ඔය දන්නා එකක් විතරයි. තව කී දෙනෙක්ව අමාරුවේ දාලද දන්නේ නෑ. හැබැයි සර් ආයේ මුන් දෙන්නා මේ පැත්තේ පළාතේ අවොත් නේ කකුල් කඩල ටයර් ගලවල කරේ තියාගෙන තමයි යන්න වෙන්නේ

පොලිසි - හරි හරි. තමුසෙලා නීතිය අතට ගන්නේ නැතුව ඉන්නවකෝ. ඒකට නේ අපි ඉන්නේ. මොනාහරි තිබුනොත් පොලිසියට එන්න වෙයි කට උත්තර දෙන්න

කුමාර- කියන්න සර්. මම ඕන වෙලාවක් එන්නම්. සාක්කි දෙන්න ඕන නං උසාවි හරි එන්නම්

*පොලිස්- ඔව්. ඕන වුනොත් උසාවි එන්නත් වේවි. හා එනවා එනවා යන්න. සාජන් කාර් එක අරගෙන එන්න. මෙයාල ජීප් එකේ එවි. මෙච්චර කියලත් පාඩමක් ඉගෙන ගන්නේ නැත්තං මෙහෙම සලකල මදි. හ්ම්ම් නගිනවා ගිහින් ජීප් එකට*

ඊට පස්සේ දෙන්නවත් කුදලගෙන ජීප් එකට දාගත්තා. දෙන්නගේ මූණවල් බේරී වෙලා කර කියා ගන්න දෙයක් නැතුව හිටියේ ඒ වෙලේ නං. අර යකා ගේ හමුදා කෙරුම් මුකුත් ඒ වෙලේ නෑ. මොකද පොලිස් පොතේ ලිය වුනා කියන්නේ ආයේ ඉතින් ආමි එකෙත් inquiry යනවා නේ. පොලිස් ජීප් එක ගියාට පස්සේ කුමාර අයිය ආවේ වීල් එකට

*අනේ අයියේ. මම නිසා ලොකු කරදයක් නේද ඔක්කොටම*

*මොන පිස්සුද මිස්. අද ඔහොම පාඩමක් ඉගැන්නුවේ නැත්තං ඕකුන් තවත් එනවා මෙහෙ. කෝකටත් නෝනා පොඩ්ඩක් පරිස්සමින් ඉන්න මේ ටිකේ*

*ඔව්. ඒක තමයි. මේ ටිකේ කැම්පස් එකේම ඉන්න වෙනවා. ගෙදර යන්නත් හොද නෑ දැන්ම*

*ඔව්. ඒක හොදයි.*

*මම වීල් එකෙන් බැහැල සල්ලි දීල තැන්ක්ස් කරලා පිනුත් දීල ආවේ කුමාර අයියට. එන ගමන් වත්සලාට කෝල් එකක් ගත්තා*

*හලෝ වත්සලා. මාර වැඩේ වුනේ. සමහර විට පොලිසියෙන් එවි හොටෙල් එකට*

*අහ්හ් ඒ මොකෝ සදා? මොකද උනේ??*

මුං දෙන්න ඇවිල්ල මෙතන හන්දියට වෙලා ඉන්නවා මම එද්දී. වෙලාවට මම වීල් එකේ ආවේ. පස්සේ වීල් එකේ අයියට මට ඔක්කොම කියනන් උනා. මිනිහ ඊට පස්සේ කට්ටිය එකතු කරගෙන දෙන්නට හොදට සැලකුව. මේවා ගම් නේ. ඉතින් කැම්පස් එකේ කාට හරි මොනාහරි නං ගමේ අය උදව් කරනවා

*අම්මට සිරි එහෙමද? ඉතිං ඊට පස්සේ*

*පස්සේ සීන් එක දරුණු වෙනවා වගේ තේරුන නිසා මං සදුන් අයියට කෝල් කරලා පොලිසියෙන් ගෙන්නුවා. ඊට පස්සේ අන්න දෙන්නව ජීප් එකේ දාගෙන පොලිසියට ගියා*

නෑ මරු වැඩේ නේ.

ඔව්. ඔයා ගැනත් විස්තරේ කියන්න සිද්ද වුනා වෙලාවේ හැටියට. ඒ නිසා ගොඩක් වෙලාවට අද පොලිසියෙන් ඒවි චෙක් කරන්න. ඔයා බය නැතුව ඇත්ත විස්තර කියන්න. මේ වෙලාව තමයි ඔයාටත් ඔතනින් ගැලවෙන්න පුළුවන් හොදම වෙලාව.

ඔව්. දැන් නං මටත් ඕන දෙයක් අනේ.

ඒක නේ. ඔයා මට මොකද උනේ කියන්න. මම රෑ වෙලා ගන්නම් සදුන් අයියට කතා කරලා

හරි කෙල්ලේ. මට කියන්න මොකද වෙන්නේ කියලා

ෂුවර්. මම කෝල් එකක් ගන්නම්

මම හොස්ටල් එකට ඇවිල්ල වොෂ් එකක් දාල එද්දී මිස් කෝල් 5ක් තිබුනා. දෙකාක සදුන් අයියගෙන්. අනික් තුනම වත්සලා ගෙන්. මම ඉක්මනට සදුන් අයියට කෝල් එකක් ගත්තා

හලෝ අයියා

හා නංගි. ඔයා කොහෙද ඉන්නේ

දැන් නං හොස්ටල් එකේ ඉන්නේ

හරි. එහෙම නං කමක් නෑ. අරුන් දෙන්නව පොලිසියෙන් ගෙනල්ල තියන් ඉන්නවා. ඔයාට මේ වෙලාවේ පොලිසියට ඇවිල්ල කට උත්තරයක් දෙන්න පුළුවන් වෙයිද?

දැන් එන්න ඕනද අයියා

පුළුවන් නං හොදයි.

හැර මං එන්නම් අයියේ

කොහොමද මේ දැන් ඔයා එන්නේ.

මම අර වීල් පාක් එකේ කුමාර එක්ක එන්නම්. එයා දනනවා නේ විස්තරේ

හා ඒක හොදයි. මිනිහ ගෙන් කට උත්තරයක් ගන්න වෙනවා නේ

හරි. මම දැන්ම එන්නම්.

*ඔව්. වත්සලත් ඒවි. මොකද හොටෙල් එක search කරන්න කණ්ඩායමක් දැනටමත් යවල තියෙන්නේ*

*ඔයත් එනවද අයියේ*

*ඔව්. මමත් එම එන ගමන් පොලිසියට*

*හා හරි. ඒක හොදයි ඔයා ඉන්න එක*

*ඔව් ඔව්. ඒ නිසාම තමයි මම තකහනියේ එන්නේ.*

*අනේ තැන්ක්ස් අයියේ. මම ඉක්මනින් එන්නම්*

*හරි නංගි*

මම ඒ කෝල් එක තියල ඉක්මනට කුමාරට කෝල් එකක් අරං විස්තරේ කියල යන්න එන්න කිව්වා. මම නිසා මේ මනුස්සය ටත් කරදරේ නේ. එයා අනේ කමක් නෑ මිස්ට නොකරන උදව්වක් තියෙනවද මේ වෙලාවේ කියලා එන්නම් කිව්වා. ඊට පස්සේ තමයි මම වත්සලාට කතා කරේ

*හලෝ කෙල්ලේ. ඔයා කොහෙද?*

*තාම හොටෙල් එකේ. පොලිසියෙන් ඔක්කොම search කරනවා*

*මොනා හරි අහු වුනාද?*

*ඔව්. ක්‍රිශාන්ගේ රූම් එකේ ඉදන් කාමර වලට කැමරා හයි කරලා තියෙන දෙකක් හොයා ගත්තා. තව මිනිහගේ ලැප් එකේ තිබිලා video වගයක් හොයා ගත්තා.*

*අපි දෙන්නගේ ඒවත් තියෙනවද?*

*නෑ එකේ නෑ දැක්ක විදියට. මම එන්න කලින් ගත්තු ඒවා වගයක්. තව අර cctv පොටෝස් වගයක් තිබුනේ ඔයාගේ. ඒවා නං තිබුනා*

*ඒකට නං කමක් නෑ*

*එතකොට අර හංගපු කැමරා එක*

*ඒකත් මම දුන්නා. අද දෙන්න ඇවිල්ල කතා කරපු ඔක්කොම එකේ රෙකොර්ඩ් වෙලා තියෙනවා.*

*අහ්හ් එහෙනම් මරේ මරු. දෙන්නට ලේසි වෙන්නේ නෑ මේ පාර*

*දැන් ඔයා මොකද කරන්නේ? ඔතන ඉන්න එක සුදුසු නෑනේ මේ වෙලාවේ හැටියට*

*ඔව්. මම කලින්ම මගේ බඩු මෙහෙන් අරං ගිහින් යාලුවෙක් ගේ ගෙදර දැම්මා. ඇඳුම් ටික විතරයි තියෙන්නේ. දැන් කොහොමත් මටත් පොලිසියට යන්න වෙනවා. එහෙමම මම එනවා*

*හරි. එහෙම උනොත් ඔයා මාත් එක්ක හොස්ටල් එකට එමු අද ඉන්න*

*අනේ ඕන නෑ කෙල්ලේ. මගේ යාළුවා එනවා කිව්වා මාව ගන්න. මම එයත් එක්ක යන්නම් එහෙ*

*එයාගේ ගෙවල් වලින් අවුලක් නැද්ද?*

*නෑ නෑ. එහෙම අවුලක් නෑ*

*හරි. එහෙනම් මමත් දැන් එනවා. අපි හම්බවෙමු. සඳුන් අයියත් එනවා කිව්වා*

*ඒක නං හොදයි. බය වෙන්න දෙයක් නෑනේ එහෙනම්*

වත්සලා එක්ක කෝල් ඉවර වෙද්දී කුමාර ඇවිල්ල ඉන්නවා ගේට්ටුව ළඟ. මම යාළුවන්ට විස්තරේ පොඩ්ඩක් කියලා ඇවිල්ල වීල් එකට නැග්ගා.

*මිස්ට අවුලක් නැද්ද මේ වෙලාවේ පොලිසියට යන එක*

*කරන්න දෙයක් නෑ. කොහොමත් යන්න වෙනවා නේ කට උත්තරයක් දෙන්න. අනික සඳුන් අයියත් එනවා කිව්වා. ඒ නිසා බය වෙන්න දෙයක් නෑ*

*සඳුන් අයිය කිව්වේ*

*එයාට තමයි මම දේවල් ඔක්කොම කියලා ප්ලෑන් කරේ. එයත් පොලිසියේ ඉන්නේ*

*අහ්හ් එහෙනම් අවුලක් නෑනේ. දන්න කියන කෙනෙක් ඉන්නවා නේ*

*ඔව්. උදෙත් එයාම තමයි අර විදියට කට්ටිය එව්වේ*

*අහ්හ්හ් එහෙමද? එතකොට මිස්ද ඒ වැඩේ කරෙත්*

*ඔව් අයියේ. මුන් මට ඉන්නම දුන්නේ නෑනේ*

හොද වැඩක් නේ මිස් කරලා තියෙන්නේ. වෙන කෙල්ලෝ නං බයට හැම දේම හංගගෙන ඉන්නවා නේ

මාත් එහෙම තමයි හිටියේ. ඒ උනාට මුං එන්න එන්න කරදර කරන්න ගත්තා. අනිත් එක තව අහිංසක කෙල්ලොන්ට මේ දේම කරන්න පුළුවන් නේ

ඔව් ඒ කතාව ඇත්ත.

අනික. කෙල්ලෙක් කැමැත්තෙන් ගිහින් ඕන දෙයක් කරගන්න එක වෙනම දෙයක්. ඒ වගේ අවස්ථාවක් වුනොත් මම උනත් කැමැත්තෙන් ඒ දේවල් වලට මුණ දේවී. කවදාවත් මේ විදියට බ්ලැක් මේල් කරලා බය කරලා අහිංසක කෙල්ලන්ව අමාරුවේ දාන්න දෙන්න බෑනේ. අද මට. හෙට මං වගේම තව අහිංසක කෙල්ලෙක් වෙන්න පුළුවන්

ඒ කතාව නං සම්පූර්ණ ඇත්ත මිස්. අපිත් ඔය වගේ ආතල් ගන්නවා නැත්තේ නෑ බැදලා හිටියට. කොල්ලෝ කාලෙත් ගත්තා. දැනුත් එහෙමට නෑ කියන්න බෑ. මොකෝ දැක්කම ආසාවල් අපිටත් එනවා නේ මිස්. ඒත් කවදාවත් එහෙම කරපු කෙල්ලෙක්ව චාටර් කරන්න නෑ

අද කාලේ ඉතින් ඔහොම වටේ නොයන පිරිමි හොයා ගන්න ඉන්නේ කලාතුරකින්. ඒක ඉතිං නවත්තන්න බෑ. කොල්ලෝ විතරක් නෙමේ සමහර කෙල්ලොත් එහෙමම තමයි. මම දනන් අයත් ඉන්නවා කොල්ලෝ දෙතුන් දෙනා එක්ක එක පාර ඔහොම ආතල් එකට කරන ඒවා නං. දැන් යන විදිය එහෙම නේ. එහෙම කියල ඉතිං මේ වගේ වැඩ කරන එක කොහොම වත් අනු මත කරන්න බෑ

ඔව් මිස්. මෙව්වා වැරදි කියන්නත් බෑ හරි කියන්නත් බෑ. දැන් ගොඩක් උන් බලන්නේ කොහොමහරි කෙල්ලෙක්ව යාලු කරගෙන රූම් එකකට උස්සන් යන්න. නැත්තං box එකකට උස්සන් යන්න. මගේ වීල් එකේම කී දෙනෙක් ගිහිල්ල තියෙනවද ඔය විදියට එකම කොල්ල කෙල්ලෝ දෙතුන් දෙනෙක් එක්ක. ඒ වගේම එක කෙල්ල කොල්ලෝ එක්ක සැරින් සැරේට මේ

ඔව්. මේක ඉතින් ආයේ වෙනස් කරන්න පුළුවන් දෙයක් නෙමේ. අපි ඉන්න දැනගන්න ඕනා ඉතින් පරිස්සමට

දැන් මිස්ගේ විස්තර ඔක්කොම පොලිසියට කියනන් වෙනවා නේද?

*කරන්න දෙයක් නෑ. මේ දේවල් හංගගෙන හිටියා කියලා කාටවත් සෙතක් වෙන්නේ නෑනේ. අඩු තරමින් මගෙන් පස්සේ හරි ඔය මිනිස්සු පාඩමක් ඉගෙන ගනී නේ. එකම දේ මේ දේවල් ගැන කැම්පස් එකෙන් දන්නේ කුමාර අයියා විතරයි. ඉතිං ඔයා මේ දේවල් කාටවත් කියන්න නැත්තං කවුරුත් දැනගන්න එකක් නෑ*

*නෑ මම කාටවත් කියන්නේ නෑ මිස්. හැබැයි ඉතින් වීල් පාක් එකේ උන්ට දැන් පොඩ්ඩක් කනට වැටුන න නේ මොකක් හරි සීන් එකක් කියලා*

*ඔව්. දැන් ඉතින් නොදන්නවා වෙන්න බෑ. විස්තර හොයනවා නේ*

*ඒක තමයි. බලමුකෝ. මම පුළුවන් තරම් කටවල් ටික වහල තියාගන්න බලන්නම්*

*ලොකු උදව්වක් අයියේ. මොකද තව අවුරුදු 2ක් විතර මෙහෙ ඉන්න ඕන නේ මම*

*හරි මිස්. අපි බලමුකෝ මොකද වෙනෙන් කියල මුලින්ම පොලිසියට ගිහිල්ල*

අපි යද්දී වත්සලත් ඇවිල්ල හිටියා පොලිසියට. මම ගිහින් පැය බාගෙකින් විතර සඳුන් අයියා ආවේ. එයා කිව්වා එයා එනකං ඉන්න ඇතුලට යන් එපා කියලා. ඒ නිසා එයා ආවම එයත් එක්කම ඇතුලට ගිහින් කට උත්තර දීල ඔක්කොම වෙච්ච සංසිද්දි කියන්න උනා නොකියා බැරි උන නිසා. වත්සලත් එයාව රවට්ටලා මෙච්චර කල් කරපු දේවල් ඔක්කොම කිව්වා. අපි දෙන්නගෙම කට උත්තර නිසා දෙන්නටම කියන්න කිසි දෙයක් ඉතුරු වෙලා තිබුනේ නෑ හොටෙල් එකෙන් හම්බ වුන දේවල්, කැමරා එකේ රෙකොර්ඩ් වෙලා තිබුණ දේවල් එක්ක කරපු වැරදි ඔක්කොම පිළිගන්න සිද්ද වුනා. පස්සේ සඳුන් අයිය කිව්වා එතනින් එහාට එයා කේස් එක බලාගන්නම් අපිට ඕන වුනොත් විතරක් කට උත්තර දෙන්න ආයේ එන්න වේවි කියලා. කොහොමත් උසාවි දවසට සාක්කි දෙන්න එන්න වෙනවා කිව්වා. පස්සේ කුමාර එක්ක මම වත්සලවත් යාළුවගේ ගෙදර දාල හොස්ටල් එකට ආවා. සඳුන් අයියා අපි දෙන්නව බස්සන කන් ඇවිල්ල තමයි ගියේ. අර දෙන්නව ඇතුලේ තියල දවස් දෙකකින් උසාවි දානවා කියලා තමයි කිව්වේ. හොස්ටල් එකට ආවට පස්සේ තමයි ටිකක් නිදහසේ හුස්මක් ගත්තේ වෙච්ච හැමදේම ගැන කල්පනා කරද්දී.

දවස් දෙකකට පස්සේ කිව්වා වගේ උසාවි දාල මටයි වත්සලටයි සාක්කි දෙන්න යන්න වුනා. ඒ වගේම තවත් අපි වගේ කෙල්ලෝ 3 දෙනෙක් ඇවිල්ල හිටියා. අර video එකේ ඉන්න කෙල්ලත් ඇවිල්ල සාක්කි දුන්න නිසා දෙන්නටම බේරෙන්න බැරි උනා. අවසානේ කොහොමහරි දෙන්නට අවුරුදු 2කට ඇතුලට යන්න වුනා වගේම අගතියට පත් වෙච්ච ඔක්කොටම වන්දිත් ගෙවන්න වුනා. ක්‍රිශාන්ගේ හොටෙල් එකත් සීල් කරා. මට මිනිහගේ වයිෆ් වයි ළමයව යි දැක්කම නං ගොඩක් දුක හිතුනා. ඒ උනාට මේ දෙන්නව නැවැත්තුවේ නැත්තං මීට වඩා ලොකු දෙයක් වෙන්න තිබුනා. ඒ ගැන හිතල මම හිත හදාගත්ත. ඒ නඩුව ඉවර වෙලා වැඩි දවසක් යන්න කලින් කැම්පස් එකේ ප්‍රශ්නයක් වෙලා කැම්පස් එක දින නියමයක් නැතිව වැහුවා. ඒකත් එක්ක අපිට ගෙවල් වලට යන්න වුනා. එක අතකට එහෙම දෙයක් වෙච්ච එකත් හොදයි කියලා හිතුනා මේ වෙලාවේ හැටියට. මොකද ඕවා කොහෙන් හරි ආරංචි වෙනවා නේ කැම්පස් එකට. ඒ නිසා මාසයක් දෙකක් ගිහිල්ල එද්දී ඒ උණුසුම නැතුව ගිහිං කට්ටියට ඕක අමතක වෙලා යාවි කියලයි මම හිතුවේ. මම ගෙදර ආවට පස්සේ අම්මට මේ වෙච්ච හැම විස්තරයක්ම කිව්වා. මොකද නැත්තං වෙන කොහෙන් හරි ආරංචි වුනොත් ඒක ඊට වඩා දුකක් වෙන නිසා එයාලට. අම්ම නං දුක් වුනා හොදටම මෙච්චර කාලයක් පරිස්සම් කරගෙන ආපු මට මේ වෙච්ච දේ නිසා. කැම්පස් එක පටන් ගන්න එකත් එන්න එන්න ඇදුන නිසා ගෙදර ඉන්න එකත් මට බෝරිං වෙන්න ගත්තා. පස්සේ මම නිලූට කියලා පොඩි ජොබ් එකක් හොයා ගත්තා සේල්ස් ගර්ල් කෙනෙක් විදියට ඇදුම් කඩේක. සල්ලි උවමනාවට වඩා මට හිතේ නිදහසක් ඕන වෙලා තිබුනා ඒ වෙද්දී. මොකද අම්මා හිතේ දුකට හැම වෙලේම මට බනින එකමයි කරේ කරගත්ත ගොන් කම කියල. ෂොප් එකට යන්න පටන් අරං දෙවැනි සතියේ ඉදල අපේ ගමේ කොල්ලෙක් මගේ පස්සේ එන්න ගත්තා. මිනිහ මම කැම්පස් යන්න කලිනුත් ඔහොම ඇවිල්ල තියෙනවා. ඒ උනාට මම වැඩිය ගණන් ගත්තේ නෑ. දැන් මම උදේට යනකොට හැමදාම වගේ මිනිහත් ඇවිල්ල වටේ කැරකිලා පෙනිලා එහෙම යනවා. ඔය අතරේ කඩේ ඉන්න කොල්ලෙකුත් මම ආපු දවසේ ඉදල මට ගොඩක් උදව් කරන්න ගත්තා හැම වෙලාවේම වගේ. මිනිහ නං මට වඩා අවුරුදු 2-3ක් වැඩිමල්. හැබැයි අහිංසක කොල්ලෙක්.